<u>2007/20 ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියට සමගාමීව ඌව පළාත තුළ ගුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරිමේ</u>

## <u>කාර්ය පටිපාටි සංග්‍රහය</u>

2007/20 ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය අනුගමනය කරමින් මින් ඉදිරියට ඌව පළාත තුළ ගුරු ස්ථාන මාරු සිදු කිරීමේදී මෙහි සඳහන් කාර්ය පටිපාටි අනුගමනය කිරීමට කටයුතු කල යුතුය.

1. මූලික කරුණු

2007/20 හා 2007.12.13 දිනැති ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියේ 1 හි 1.1 සිට 1.8 දක්වා සඳහන් මූලික කරුණු මත පදනම්ව ගුරු ස්ථාන මාරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය.

2. ගුරු මාරු මණ්ඩලය

2.1. 2007/20 ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියේ 2.1,2.2,2.3,2.4 හා 2.5 හි සඳහන් පරිදි ගුරු මාරු මණ්ඩල, අභියාචනා මණ්ඩල සංයුතිය හා ක්‍රියාකාරීත්වය පවත්වා ගත යුතුය.

2.2. ගුරු මාරු මණ්ඩලයට හා අභියාචනා මණ්ඩලය සඳහා ගුරු සංගම් නියෝජිතයින් සහභාගි කරවීමේදී එක් එක් වෘත්තිය සමිතිය මඟින් නිශ්චිතව සහභාගි වන නියෝජිතයන් දෙදෙනෙකු බැගින් පූර්වයෙන් නම් කර ලේඛණ දෙකකින් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද සහභාගි විය යුත්තේ එක් වරකට එක් නියෝජිතයෙක් පමණක් වන අතර ගුරු මාරු මණ්ඩලයට ඉදිරිපත් වූ අයෙක් අභියාචනා මණ්ඩලයට ඉදිරිපත් නොවිය යුතුය.

2.3. 2024.06.20 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2024 පාදක කර ගනිමින් වෘත්තිය සමිති නියෝජිත සහභාගිත්වය සිදු කල යුතු අතර, එහි අංක 04 කරුණ පිළිබඳව සියළුම වෘත්තිය සමිති අවධානයට ගෙන නියෝජිතයින් ඉදිරිපත් කළ යුතුය. නොවැළැක්විය හැකි අවස්ථාවකදී පමණක් තම ස්ථාන මාරු තීරණයට අදාල විෂය ක්‍රියාත්මක වන මොහොතේදී අදාල නියෝජිතයා ගුරු මාරු මණ්ඩලයේ ක්‍රියාවලියෙන් අනිවාර්යෙන් ඉවත් විය යුතුය.

2.4. ගුරු මාරු මණ්ඩලය නියෝජනය කරන ලද කලාප අධ්‍යාපන කාර්යාලය/පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු නියෝජිතයින් අතරින් එක් නියෝජිතයෙක් අභියාචනා මණ්ඩලයට සහභාගි විය යුතු අතර, එම නිළධාරියා විය යුත්තේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වේ. ඊට අමතරව ගුරු මාරු මණ්ඩලය නියෝජනය නොකළ මාණ්ඩලික නිළධාරින් දෙදෙනකු දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සෑම කලාපයක් සඳහාම පත් කළ යුතු අතර පළාත් අභියාචනා මණ්ඩලය සඳහා මෙම පත්කිරීම කළ යුතු වන්නේ පළාත් අධ්‍යාපන ලේකම්වරයා විසිනි.

3. පාසල් වර්ගීකරණය

3.1. අතිදුෂ්කර, දුෂ්කර,අපහසු නොවන,පහසු,වඩාත් පහසු වර්ගීකරණය සලකා බැලිය යුතු අතර,දුෂ්කර,අතිදුෂ්කර පාසල් ලේඛණය චක්‍රලේඛ අංක 01/2024 අනුව නිකුත් කරන ලද පාසල් ලේඛණය විය යුතුය. (එම ලේඛණයේ නොමැති වුවද ඇමුණුම 01හි සඳහන් තරමක් දුෂ්කර පාසල් පළාත් අධ්‍යාපන ලේකම්වරයාගේ අනුමැතිය මත ගුරු ස්ථාන මාරු ක්‍රියාවලියේදී පමණක් දුෂ්කර සේ සැලකීමට කටයුතු කළ යුතුයි.)

3.2. ස්ථාන මාරු සඳහා සලකා බලනු ලබන්නේ, පහත පරිදි වර්ග 4ක් යටතේ වර්ගීකරණය වේ.

3.2.1. දුෂ්කර/අතිදුෂ්කර පාසල් වර්ගය

3.2.2. අපහසු නොවන පාසල් වර්ගය

3.2.3. පහසු පාසල් වර්ගය

3.2.4. වඩා පහසු පාසල් වර්ගය

4. සේවා කාලය

4.1. 2007/20 ජාතික ගුරු මාරු ප්‍රතිපත්තියේ සඳහන් පරිදි පාසල් වර්ගය අනුව අවම සේවා කාලය පහත පරිදි වේ.

4.1.1. දුෂ්කර/අතිදුෂ්කර පාසලක අවම සේවා කාලය අවුරුදු 03

4.1.2. අපහසු නොවන පාසලක අවම සේවා කාලය අවුරුදු 04

4.1.3. පහසු පාසලක උපරිම සේවා කාලය අවුරුදු 08

4.1.4. වඩා පහසු පාසලක උපරිම සේවා කාලය අවුරුදු 06

4.2. එසේම පාසල් පාදකව ලබා දෙන නව පත්වීම් වලදී පත්වීම් ලිපියේ කොන්දේසි ක්‍රියාත්මක විය යුතුය.

5. අනිවාර්යය ගුරු ස්ථාන මාරු

5.1. එකම පාසලක වසර 8ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියළුම ගුරුවරුන් අනිවාර්යය ස්ථාන මාරු ක්‍රියාවලියට යටත් වේ.

5.2. එබැවින් සෑම වර්ෂයකම මැයි 31 දිනට එකම පාසලක සේවා කාලය වසර 8ක් සම්පූර්ණ කරන ලද ගුරුභවතුන් ස්ථාන මාරු අයදුම් කිරීම අනිවාර්යය වේ.(දී ඇති ආකෘතිය ප්‍රකාර අයදුම්පත ඇමුණුම 02) අයදුම්පත් ඉදිරිපත් නොකලද අදාල සේවා කාලය ඉක්මවූ ගුරුවරුන් ස්ථාන මාරු කිරීමේ බලය ගුරු මාරු මණ්ඩලයට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට මෙමඟින් පැවරෙනු ඇත. එබැවින් අදාල පාසලේ විදුහල්පති මඟින් එම පාසලේ සේවා කාලය සඳහන් ලේඛනයක් (ඇමුණුම 03 පරිදි) සහතික කර ගෙන්වා ගත යුතුය. එම ලේඛණය වැටුප් ලේඛණය හා සසඳා තහවුරු කර ගැනීම ගුරු ස්ථාන මාරු විෂය භාර අධ්‍යක්ෂවරයාගේ වගකීමකි.

5.3. අනිවාර්ය ස්ථාන මාරු සිදු කිරීමේදී දුෂ්කර/අතිදුෂ්කර පාසලක අවම සේවා කාලය සම්පූර්ණ කරන ලද ගුරුවරයෙක් නැවත දුෂ්කර/අතිදුෂ්කර පාසලක ඔහුගේ/ඇයගේ කැමැත්තකින් තොරව ස්ථාන මාරු නොකළ යුතුය. තම සේවා කාලය තුළ දුෂ්කර/අතිදුෂ්කර පාසලක සේවය කර නොමැති ගුරුවරුන් එම වර්ගයේ පාසලකට ස්ථාන මාරු කිරීමේ හැකියාව පවතී.

5.4. අනිවාර්යය ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී විෂය අනුව ගැලපීම සිසු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය සාධකයක් වන බැවින්, ඒ පිළිබඳ අවධානය යොමු කිරීම ගුරු මාරු මණ්ඩලයේ සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සතු වගකීමකි.

5.5. අනිවාර්යය ස්ථාන මාරු සිදු කිරීමේදී ප්‍රාථමික අංශයේ අවධි පිළිබඳව සැලකිලිමත් විය යුතුය. අවධියක් සම්පූර්ණ නොකරන ලද ගුරුවරයෙක් සේවා කාලය වසර 8 සම්පූර්ණ කලද, ස්ථාන මාරුව සිදු කල යුත්තේ අවධිය අවසන් වන ඊළඟ වර්ෂයේ සිටය. ඒ අනුව 2,4,5 ශ්‍රේණි ගුරුවරුන් එක් කාණ්ඩයක් ලෙසද 1,3 ශ්‍රේණිවල ගුරුවරුන් තවත් කාණ්ඩයක් ලෙසද සලකා 2,4,5 ශ්‍රේණි වල ගුරුවරුන් අදාල වර්ෂය තුළද, 1,3 ශ්‍රේණිවල ගුරුවරුන් අවධිය අවසන් කරනු ලබන වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

5.6. අනිවාර්ය ස්ථාන මාරු සිදු කිරීමේදී වයස අවුරුදු 55 ඉක්ම වූ අය(මැයි 31 දිනට) ඔවුන්ගේ කැමැත්තකින් තොරව ස්ථාන මාරු නොකළ යුතුය.

5.7. වඩා පහසු පාසලක සේවය කරන ලද ගුරුවරයෙක් ගුරු මාරු ක්‍රියාවලියකට ලක් කිරීමේදී, එම ස්ථාන මාරුව විෂය ගැලපෙන පරිදි පහසු පාසලකට, අපහසු පාසලකට හෝ දුෂ්කර/අතිදුෂ්කර පාසලකට ලබාදීමට ප්‍රමුඛතාවයක් දිය යුතුය.

5.8. දුෂ්කර/අතිදුෂ්කර හා අපහසු නොවන පාසලක සේවය කරන ලද ගුරුවරුන් ස්ථාන මාරු ක්‍රියාවලියට ලක් කිරීමේදී පහසු පාසල් හෝ වඩා පහසු පාසල් ලබා දීමට ප්‍රමුඛතාවක් දිය යුතුය.

6. අනිවාර්ය ස්ථාන මාරු වලට අදාල නොවන වාර්ෂික ස්ථාන මාරු

6.1. ස්ථාන මාරුවක් අයදුම් කිරිමට හිමිකමක් ඇති ගුරුවරයෙකු ස්ථාන මාරු අයදුම්පතක් ඉදිරිපත් කිරීමේදී අනුප්‍රාප්තිකයකු සහිතව හෝ රහිතව එම අයදුම්පත් අත්සන් කර දීමට අදාල පාර්ශව කටයුතු කළ යුතුය.

6.2. අනුප්‍රාප්තිකයකු සහිත නිර්දේශ යටතේ ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු අනිවාර්යය ස්ථාන මාරු සමඟ ගැලපිය හැකි අවස්ථා වලදී ගලපා ගැනීමට හැකියාව පවතින අතර, ඒ සඳහා අවම සේවා කාලය අදාල කරගත යුතුය. එසේම එවැනි අවස්ථාවක ඔවුන් ඉල්ලා සිටින පාසල් ලබාදීමට කටයුතු කිරීම ද අවශ්‍ය වේ.

6.3. නියමිත සේවා කාලය සම්පූර්ණ නොකරන ලද ගුරුවරයෙක් සෞඛ්‍ය හේතුවක් මත/සුවිශේෂී හේතුවක් මත ස්ථාන මාරු අයදුම් කළ විට, එය අභියාචනයක් සමඟ ඉදිරිපත් කළ යුතු අතර, එය මාරු මණ්ඩලයට, අභියාචනා මණ්ඩලයට හා වෛද්‍ය මණ්ඩලයකට ඉදිරිපත් කර ඉදිරි කටයුතු කළ යුතුය.

6.4. ගුරුවරයෙක්ට තමාගේ, කාලත්‍රයාගේ, දරුවන්ගේ සහ දෙමාපියන්ගේ/කාලත්‍රයාගේ දෙමාපියන්ගේ සෞඛ්‍ය ගැටළුවක් මත ස්ථාන මාරුවීමක් ඉල්ලා සිටිය හැක. එවැනි ඉල්ලීමක් සලකා බැලිය යුතු වන්නේ වෛද්‍ය මණ්ඩලයකට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගැනීමෙන් පසුවය.

6.5. 6.3,6.4 යටතේ ස්ථාන මාරුවක් අභියාචනා මණ්ඩලය මඟින් නිර්දේශ වු අවස්ථාවක ඒ සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ, පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ හැක.

7. අතිරික්ත ගුරුවරුන් තුලනය කිරීම.

7.1. එකම පාසලක එක් විෂයක් සඳහා 6/2021 චක්‍ර ලේඛ ප්‍රකාරව සිටිය යුතු ගුරු සංඛ්‍යාව ඉක්මවා ගුරුවරු සිටින්නේ නම් එය ගුරු අතිරික්තයක් ලෙස සලකනු ලැබේ.

7.2. අතිරික්ත ගුරුවරයා නම් කිරීම

7.2.1.පාසල් වර්ගය අනුව එහි සිටිය යුතු අවම සේවා කාලය ඉක්මවා සිටින ගුරුවරයා අතිරික්ත කල යුතුය.

7.2.2. විෂයට අදාලව සිටින සියළුම ගුරුවරුන්ගේ අවම සේවා කාලය ඉක්මවා නොමැති අවස්ථාවකදී අඩුම සේවා කාලයක් සහිත ගුරුවරයා අතිරික්ත සේ සලකනු ලැබේ. එසේ වුවද අදාල සේවා කාලය අඩු ගුරුවරයා නැවත ස්ථානගත කළ යුත්තේ ඔහු හෝ ඇය සිටින ලද පාසල් වර්ගයට අයත් පුරප්පාඩු සහිත පාසලකටය.

7.2.3.වසර අවු 55 ට වැඩි ගුරුවරයෙක් අතිරික්ත වන අවස්ථාවක අදාළ ගුරුවරයාගේ කැමැත්ත නොමැතිව ස්ථාන මාරු කල නොහැකි බැවින් ඒ වෙනුවට ඊලගට සේවා කාලය වැඩි ගුරුවරයා අතිරික්ත කල යුතුය.(7.2.1 ,7.2.2 අනුව)

7.2.4. අතිරික්ත ගුරුවරයා නිවැරදිව (උක්ත නිර්නායක අනුව) හඳුනාගැනීම සඳහා විෂයට අදාල (අතිරික්ත) ගුරුවරුන්ට හා විදුහල්පතිට වෙන වෙනම ආකෘති දෙකක් ලබාදී තොරතුරු තහවුරු කර ගත යුතුය.(ඇමුණුම 4,5)

7.3. අතිරික්ත තුලනය කිරීමේ කමිටුව හඳුනා ගනු ලැබූ අතිරික්ත තුලනය කිරීම සඳහා විෂය භාර අධ්‍යක්ෂ, ස්ථාන මාරු විෂය අධ්‍යක්ෂ හා තවත් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ පත් කර ගත යුතුය. එසේ සකස් කරනු ලැබූ අතිරික්ත තුලනය කිරීමේ ලේඛණය ගුරු මාරු මණ්ඩලය වෙත ඉදිරිපත් කර නිර්දේශ ලබා ගත යුතුය.

7.4. අතිරික්ත ගුරුවරු තුලනය කිරීමෙන් පසු ඔවුන්ට අභියාචනා ඉදිරිපත් කිරීමටද අවස්ථාවක් සලසා දිය යුතු වන්නේය. එම අභියාචනා සඳහා අභියාචනා මණ්ඩලය මඟින් පිළිතුරක් ලැබෙන තෙක් දැනට සේවය කරන පාසලේ සේවය කිරීමට හැකියාව පවතී.

7.5. අතිරික්ත ගුරුවරු තුලනය කිරීමේදී සලකා බැලිය යුතු කරුණු

7.5.1. ගුරුවරයා තම පෙර සේවා කාලය තුළ දුෂ්කර/අතිදුෂ්කර පාසලක සේවය කර නොමැති නම් දුෂ්කර/අතිදුෂ්කර පාසලකකට ස්ථාන මාරු කිරීම කළ හැක. (පුරප්පාඩු පදනම් කර ගනිමින්)

7.5.2.පෙර සේවා කාලය තුළ දුෂ්කර/අතිදුෂ්කර පාසලක සේවය කර නොමැති ගුරුවරයෙක් දැනට සේවය කරනු ලබන කලාපයෙන් පිටත කලාපයක දුෂ්කර/අතිදුෂ්කර පාසලකට ස්ථාන මාරු කරන්නේ නම් වසර 02 සේවා කාලයෙන් පසු නැවත පදිංචි කලාපයේ පහසු පාසලක් ලබා දීමේ ලිඛිත එකඟතාවය මත එවැනි පාසලකට ස්ථාන මාරු කිරීම.

7.5.3.කලාපයෙන් පිටත පාසලක දෙවරක් දුෂ්කර/අතිදුෂ්කර පාසලක අවම සේවා කාලයට එකඟ වන ගුරුවරුන් සඳහා එම සේවා කාලය (දෙවනවර) වසර 2කට සීමා කිරීම හා වසර 2ක සේවයෙන් පසු පදිංචි කලාපයේ වඩා පහසු පාසලකට ලබාදීමේ එකඟතාවය මත ස්ථාන මාරු කිරීම

7.5.4.වසර 55ට වැඩි ගුරුවරුන්ගේ කැමැත්ත නොමැතිව තුලනය කිරීමේ ක්‍රමවේදය යටතට නොගැනීම.

7.5.5.අභියාචනා ලෙස සෞඛ්‍ය ගැටළු ඉදිරිපත් වන්නේ නම් වෛද්‍ය මණ්ඩල නිර්දේශ සලකා බැලීම සිදු කළ යුතුයි.

7.6. අතිරික්ත ගුරුවරුන් ලෙස විදුහල්පති අනුප්‍රාප්තිකයෙක් රහිතව නිදහස් කරන අවස්ථා

7.6.1.වසර 8ක සේවා කාලය සම්පූර්ණ කළ විදුහල්පති අනුප්‍රාප්තිකයකු රහිතව මුදාහරින ගුරුවරයෙකු අන්තර් කලාප,අන්තර් පළාත් ස්ථාන මාරුවක් ඉල්ලා සිටින්නේ නම්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින්ද එම ගුරුවරයා අනුප්‍රාප්තිකයකු රහිතව මුදා හැරිය යුතුය.

7.6.2.නියමිත අවම සේවා කාලය සේවය නොකළ ගුරුවරයෙක් අනුප්‍රාප්තිකයකු රහිතව නිදහස් කළ යුත්තේ අතිරික්ත ගුරුවරු තුලනය කිරීමේ ක්‍රමවේදය අනුගමනය කරමිනි.

7.6.3.නියමිත අවම සේවා කාලය සම්පූර්ණ නොකරන ලද ගුරුවරයෙක් යම් සුවිශේෂී හේතුවක් මත අනුප්‍රාප්තිකයකු රහිතව නිදහස් කරන්නේ නම්, ඒසඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

8. නව පත්වීම් වලදී/වාර්ෂික ස්ථාන මාරු ගුරුවරු ස්ථානගත කිරීම

8.1. නව පත්වීම් වලින් ගුරුවරුන් ස්ථාන ගත කල යුත්තේ පුරප්පාඩු පවතින පාසල් වෙත හා නියමිත සේවා කාලය සම්පූර්ණ ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින ගුරුවරු වෙනුවෙන් විය යුතුය.

8.2. අනිවාර්ය ගුරු ස්ථාන මාරු හා වෙනත් වාර්ෂික ස්ථාන මාරු වලදීද 6/2021 චක්‍ර ලේඛ අවශ්‍යතා ඉක්මවා ගුරු මාරුවීම් නොකළ යුතුය.

(නිහාල් ගුණරත්න)
ඌව පළාත් අධ්‍යාපන ලේකම්

නිහාල් ගුණරත්න
ලේකම්
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
අධ්‍යාපන පළාත් පාලන, ඉඩම්, විදුලි බල හා බලශක්ති
ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය
ඌව පළාත් සභාව, බදුල්ල